# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)

**ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්/ප්‍රමාණ සමීක්ෂණ/විදුලි හා විද්‍යුත්/යාන්ත්‍රික) සහ කර්මාන්ත තාක්‍ෂණඥයින් සඳහා ජාතික සහතිකය (සිවිල්/යාන්ත්‍රික/විදුලි) සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පස්වන මට්ටම හා සම කිරීමේ පොදු විභාගය**

## ජාතික තාක්ෂණ සහතිකය (NCT) සහ කර්මාන්ත තාක්‍ෂණඥයින් සඳහා ජාතික සහතිකය (NCIT) සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)

01. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්/ප්‍රමාණ සමීක්ෂණ/විදුලි හා විද්‍යුත්/යාන්ත්‍රික) සහ කර්මාන්ත තාක්‍ෂණඥයින් සඳහා ජාතික සහතිකය (සිවිල්/යාන්ත්‍රික/විදුලි) සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පස්වන මට්ටම හා සම කිරීමේ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා පොදු විභාගයක් පැවැත්වීමට තීරණය කර ඇත. ඉදිකිරීම් තාක්ෂණය (Construction Technology) / ප්‍රමාණ සමීක්ෂණ (Quantity Surveying) / විදුලි තාක්ෂණය (Electrical Technology) / නිෂ්පාදන තාක්ෂණය (Production Technology) / පෑස්සුම් තාක්ෂණය (Welding Technology) / මෝටර් රථ තාක්ෂණය (Automobile Technology) / ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණය (Ref & AC Technology) පස්වන මට්ටමේ ජාතික නිපුණතා සම්මත සහ නිපුණතා පාදක විෂය මාලාවන් හි විෂය කරුණු වලට අදාළ ව එම විභාගය පවත්වනු ඇත.

02. 2014 හෝ ඊට ප්‍රථම ඉහත පාඨමාලාව සඳහා ඇතුලත් වූ සහතික පත්‍ර ලාභීන් හට මෙම විභාගය සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

03. විභාග ගාස්තු වශයෙන් රුපියල් **1000.00** (දහසක්) ගෙවිය යුතු අතර එම ගෙවීම මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් **"තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව"** ගිණුම් අංක **07810017226604**4 යන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මුදල් තැන්පත් ලදු පත අයදුම්පත සමග අමුණා තිබිය යුතු වේ.

04. මෙම ලිඛිත විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් හට වෘත්තීය සමාලෝචන වාචික පරීක්‍ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතු අතර එම අවස්ථාවේ දී රුපියල් **2000.00** ගාස්තුවක් ගෙවිය යුතු වනු ඇත.

05. පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත, කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"NCT (සිවිල්/ප්‍රමාණ සමීක්ෂණ/විදුලි හා විද්‍යුත්/යාන්ත්‍රික) / NCIT (සිවිල්/විදුලි /යාන්ත්‍රික) පොදු විභාගය"** ලෙස ඔබට අදාල විභාගය සඳහන් කර **"අධ්‍යක්‍ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2021.04.23** දින හෝ ඊට ප්‍රථම යොමු කල යුතු වේ.

සටහන : ඔබට නියමිත දිනට අයදුම් කිරීමට නොහැකි වුවහොත් වෘත්තීය පරිණතභාවය මත (ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ 01/2019) හෝ බාහිර අයදුම්කරුවන් (ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ 05/2017) මගින් අයදුම් කල හැකිය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර විභාගයට ලියාපදිංචි වීම සඳහා පහත ලින්ක් එක භාවිතා කරන්න.
**https://nvq.gov.lk/NCT/ApplicationWelcome**

### ජාතික තාක්‍ෂණ සහතිකය (සිවිල්/ප්‍රමාණ සමීක්ෂණ/විදුලි හා විද්‍යුත්/යාන්ත්‍රික) සුදුසුකම හා කර්මාන්ත තාක්‍ෂණඥයින් සඳහා ජාතික සහතිකය (සිවිල්/යාන්ත්‍රික/විදුලි) ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටම සම කිරීම සඳහා පවත්වන පොදු විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත

1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සහතික පත්‍රයේ සඳහන් පරිදි) (සිංහලෙන්) : ..............................
(ඉංග්‍රීසියෙන්) : ..............................

2) ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

3) ලිපිනය (සිංහලෙන්) : ..............................
(ඉංග්‍රීසියෙන්) : ..............................

4) විද්‍යුත් තැපෑල : ..............................

5) දුරකථන අංකය : ..............................

6) පාඨමාලා කාලය : .................... සිට .................... දක්වා

7) සහතික පත්‍රය වලංගු දිනය : ..............................
(කරුණාකර සහතික පත්‍රයේ සහතික කළ පිටපතක් අමුණන්න.)

8) **NCT / NCIT** පාඨමාලාව අනුව ඔබ විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන නියමිත තාක්‍ෂණ විෂය ධාරාව තෝරා යටින් ඉරක් අඳින්න.

ඉදිකිරීම් තාක්‍ෂණය / ප්‍රමාණ සමීක්‍ෂණය / විදුලි තාක්‍ෂණය / නිෂ්පාදන තාක්‍ෂණය /
පෑස්සුම් තාක්ෂණය / මෝටර් රථ තාක්‍ෂණය / ශීතකරණ හා වායු සමීකරණ තාක්‍ෂණය

9) අයදුම්කරුගේ ප්‍රකාශය

9.1 ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

9.2 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, මහජන බැංකු ගිණුම් අංක 07810017226604 දරණ ගිණුමට රුපියල් 1000.00 ක් බැර කර ලබා ගත් කුවිතාන්සිය මේ සමග අමුණා ඇත.

දිනය .................... අත්සන ....................

අධ්‍යක්ෂ ජනරාල්,
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
"නිපුණතා පියස", 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
දු.අ. : 011-760 8000, 011-760 8060